# Cash sheet Calculator

දෛනික මුදල්පත්‍රය සකස් කර තුලනය කර ගැනීම සඳහා පහසුවක් ලෙස Cash Sheet Calculator නමින් වෙබ් පිටුවක් සකස් කර ඇති අතර ඒ වෙත පිවිසීම සඳහා eCounter මෘදුකාංගයේ වම් පස මෙනුවේ අවසානයට ඇති about මෙනුවට කලින් Cash Sheet Calculator ලෙස ඇති මෙනුවට click කරන්න.

Cash Sheet Calculator භාවිතයේ දි පහත සඳන් උපදෙස් පිළිපදින්න.

1. "A"- ඉ.ගෙ. ශේෂය, "B"- ලැබිය යුතු පසු ගෙවීම් සේවා ආදායම්, "C"- ඉ.ගෙ. අත ඉතිරි තොගය සහ "G"- කලින් දින අත්තිකාරම් වලින් ලැබිය යුතු මුදල් යන කොටු තුල කලින් දිනයෙන් ඉදිරියට ගෙනෙන ශේෂ ඇතුලත් කරන්න.

2. "D"-දෛනික ලැබීම් කොටුව තුල දිනය තුලදි තැපැල් කාර්යාලයෙන් කරන ලද සේවාවන් වලින් ලද ආදායම් ඇතුලත් කරන්න.

3. "H"-දෛනික ගෙවීම් කොටුව තුල දිනය තුලදි තැපැල් කාර්යාලයෙන් කරන ලද ගෙවීම් ඇතුලත් කරන්න.

4. "J"-තැපැල් ස්ථානාධිපතිගෙන් ලැබිය යුතු ශේෂය කොටුව තුල ඇති 01- මුදල් ඇණවුම් ගිණුම් හි මුදල් ඇණවුම් සාරාංශයේ සඳහන් මුදල ඇතුලත් කරන්න.

5. මුදල් ඇණවුම් සාරංශයේ ඇත්තේ මුදල් ඇණවුම් ගිණුමේ ශේෂයක් නම් "I"-01 කොටුව තුලද මුදල් ඇණවුම් පැවරිමක් නම් "E"-01 කොටුව තුලද අතුලත් කරන්න.

-----------------

මුදල් ගිණුම පරික්ෂා කිරිමට මුදල් ඇණවුම් සාරාංශය හා රෙමිටන්ස් ෂිට් සකස් කර අවසන් විය යුතුය.

-----------------

**පහත සඳහන් කොටු තුල කිසිවක් සටහන් නොකල යුතු අතර ඒවා හි අගයන් ස්වයංක්‍රියව සකස් වේ.**

1. "I" ගිණුම් කාර්යාලයට මුදල් යැවීම (පැරණි 20 කොටුව)
2. "F" අත්තිකාරම් දෙන ලද මුදල් සඳහා ලැබිය යුතු මුදල් හි 01. මුදල් ඇණවුම් කොටුව හැර ඉතිරි සියළු කොටු.
3. "J" තැපැල් ස්ථානාධිපතිගෙන් ලැබිය යුතු ශේෂය
4. "K" ලැබිය යුතු පසු ගෙවුම් සේවා ආදායම
5. "L" ඉ.ගෙ. අත ඉතිරි තොගය

Cash sheet පත්‍රය නිවැරදිව තුලනය වී ඇත්නම් අවසන් එකතුව කොළ පාටින් හරි ලකුණක් සහිතව ද වැරදිනම් රතු පාටින් කතිරයක් සහිතව ද දර්ශණය වේ.

ඉතිරි ප්‍රේෂණ යටතේ ඇති කොටු තුල අගයන් සටහන් කලයුතු අතර එකතුව ස්වයංක්‍රීයව සකස් වේ.

මෙම වෙබ් පිටුවේ පහල ඇති Optimize බටනය ක්ලික් කල විට අවශ්‍ය කොටස් පමණක් ඉතිරි වී Cash sheet පත්‍රය කෙටි වී සකස් වන අතර print බටනය ක්ලික් කිරිම මගින් එහි මුද්‍රිත පිටපතක් ලබා ගත හැකි වේ. නැවත වරක් Optimize බටනය ක්ලික් කිරීම මගින් පෙර තිබූ පරිදි Cash sheet පත්‍රය සකස් වේ.

මෙම වෙබ් පිටුවේ අවසානයේ Tell us your feedback ඔබගේ වටිනා අදහස් අපට කියන්න යනුවෙන් සබැඳියක් ඇති අතර එමගින් ඔබගේ අදහස් අප වෙත ඉදිරිපත් කල හැකි වේ.